**දකුණු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය - 2015**

---------------------------------------------------------------

දකුණු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 මැයි 27 දින එළඹි අංක 3028 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ I ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. අධිවේගී මාර්ග ජාලය සම්බන්ධ කෙරෙන ජාතික මහාමාර්ග පිරික්සීම, ශක්‍යතා අධ්‍යයනය හා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් පිළියෙල කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 801.34 කට සමාන එජඩො මිලියන 6.08 ක් වූ අතර ඉන් රු.මිලියන 659 කට සමාන එජඩො මිලියන 5 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 අගෝස්තු 22 දින ආරම්භ කරන ලද අතර 2019 ජූනි 30 වන විට නිමකිරීමට නියමිතය. අධිවේගී මාර්ග ජාලය සම්බන්ධ කෙරෙන ජාතික මහාමාර්ග පිරික්සීම, ශක්‍යතා අධ්‍යයනය හා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් පිළියෙල කිරීම යටතේ උපදේශක සේවා 2014 දෙසැම්බර් 09 දින ආරම්භ කරන ලද අතර 2016 ජූනි 09 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත් ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 02 ට අනුකූලව පිළියෙල කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මුදල් ගලා ඒම් සහ පිටට ගලා යාම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන වෙනත් ශේෂ සමඟ අනුකූල වී නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

විගණනයේදී පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 9.10 ක් වූ උපදේශක ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන කෙරීගෙන යන වැඩ හා ජංගම බැරකම් ශේෂයන් එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මෙම ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා ස්ථාපනය කරන ලද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින්ම “උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය” නම් වූ වෙනත් ණය ආධාර මුදල්

සපයන ව්‍යාපෘතියක කාර්යයන් නියාමනය කරන අතර ව්‍යාපෘතිවල මෙහෙයුම් පිරිවැය අදාළ ව්‍යාපෘති අතර බෙදාහැරීමට කටයුතු කිරීමෙන් තොරව එම ව්‍යාපෘතියට සෘජුවම අයකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ව්‍යාපෘතියේ වර්ධක පිරිවැය සංරචකය යටතේ කරන ලද රු.මිලියන 39.59 ක් වූ වෙන්කිරීම් 2015 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමෙන් තොරව පැවතුණි.

### 2.2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

උපදේශක සේවා ගිවිසුමේ විශේෂ කොන්දේසි 45.1 (අ) වගන්තිය අනුව, රු.මිලියන 25.39 කට සමාන එජඩො 193,782 ක අත්තිකාරම් ගෙවීමක් සහ කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 15 ක් නියෝජනය වන රු.මිලියන 19.37 ක් කොන්ත්‍රාත් කාලපරිච්ඡේදයේ මාස 5 සිට 12 දක්වා සමාන වාරික 08 කින් මාසික උපදේශක සේවා ගෙවීම්වලින් අයකර ගත යුතුය. ඒ අනුව, වැඩපූර්ව අත්තිකාරම් 2015 නොවැම්බර් වන විට සම්පූර්ණයෙන් අයකර ගත යුතුය. කෙසේ වුවද 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් රු.මිලියන 204.51 ක් වූ උපදේශක ගාස්තු ගෙවා තිබුණද, ව්‍යාපෘතිය විසින් වැඩ පූර්ව අත්තිකාරම් අයකර ගෙන නොතිබුණි. තවද උපදේශක විසින් ඒ සඳහා ඉදිරිපත් කරන ලද සහතික බැඳුම්කර 2015 නොවැම්බර් 30 දිනට කල් ඉකුත් වී තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 5.00 | 659.00 | 201 | 1.3 | 150.71 | 1.48 | 195.47 |
| ශ්‍රී ලං ර | 1.08 | 142.34 | 5 | - | 5.00 | - | 5.00 |
| | 6.08 | 801.34 | 206 | 1.3 | 155.71 | 1.48 | 200.47 |

**3.2 භෞතික ප්‍රගතිය**

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.මිලියන 461.61 කට සමාන එජඩො මිලියන 2.27 ක පිරිවැයකට දකුණු අධිවේගී මාර්ගයට සම්බන්ධ කෙරෙන ජාතික මහාමාර්ග කිලෝමීටර් 200 ක් පිරික්සීම, ශක්‍යතා අධ්‍යයනය හා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සඳහා උපදේශක සේවා සැපයීම වෙනුවෙන් ප්‍රධාන කොන්ත්‍රාත්තුව 2014 දෙසැම්බර් 09 දින ආරම්භ කරන ලද අතර 2016 ජුනි 09 දිනට නිම කිරීමට සැලසුම් කර තිබුණි. ප්‍රගති වාර්තා අනුව, වැඩවලින් සියයට 60 ක් 2015 දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණි.

(ආ) තවද, පාලම්/ ව්‍යුහ ඉංජිනේරුවන්, මහාමාර්ග ඉංජිනේරුවරයකු සහ ප්‍රවාහන සැලසුම් සඳහා ඉංජිනේරුවරයකු වශයෙන් වෙනත් උපදේශකවරුන් එකතුව රු.මිලියන 51.87 ක පාරිශ්‍රමිකයන්ට ප්‍රධාන කොන්ත්‍රාත්කරුට සහාය වීම සඳහා වෙනම උපදේශකවරුන් වශයෙන් පත්කර තිබූ අතර ඔවුන්ට පවරන ලද වැඩ 2016 මාර්තු 31 වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද පාලම්/ ව්‍යුහ ඉංජිනේරුවරයෙකුට පවරන ලද වැඩ සමාලෝචිත වර්ෂය අවසානයට සියයට 30 ක භෞතික ප්‍රගතියක් පමණක් ලෙස වාර්තා වී තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

----------------------------

උපදේශක කාර්යයන් 2014 දෙසැම්බර් 09 දින ආරම්භ කර තිබුණද, ව්‍යාපෘතිය විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් එකතු කළ අගය මත බදු අත්හැරීම් පිළිබඳ ඉල්ලීම මාස 05 ක ප්‍රමාදයන් සහිතව 2015 මැයි 19 දින සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය විසින් රු.මිලියන 6.78 ක් හා රු.මිලියන 1.23 ක් පිළිවෙලින් එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු ලෙස ගෙවා තිබුණි.